# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 553/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 30/03/2024 පැය 1905

## මාධ්‍ය නිවේදනය

### පාස්කු ඉරිදා දේව මෙහෙයන් පැවැත්වෙන කිතුණු දේවස්ථාන සඳහා ආරක්ෂාව සැපයීම සම්බන්ධව - පොලිස් මූලස්ථානය.

2024.03.31 වන දිනට යෙදී ඇති පාස්කු ඉරිදා දේව මෙහෙයන් පවත්වනු ලබන සියළුම කිතුණු දේවස්ථාන සඳහා විශාල බැතිමතුන් පිරිසක් සහභාගී වනු ඇතැයි අපේක්ෂා කරන අතර, මේ හේතුවෙන් විශේෂ පොලිස් ආරක්ෂාවක් යෙදවීමට පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා විසින් සියළුම පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත උපදෙස් ලබාදී තිබිණි.

ඒ අනුව, ලංකාව පුරා පොලිස් වසම්වල පිහිටා තිබෙන කිතුණු දේවස්ථාන 1873 ක පාස්කු ඉරිදා දින දේව මෙහෙයන් පවත්වනු ලබන අතර එම දේවස්ථාන හා ආශ්‍රිත ප්‍රදේශ ආවරණය වන පරිදි ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් 6522ක්, පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් 320 ක් සහ ත්‍රිවිධ හමුදා නිලධාරීන් 2746 දෙනෙකු යෙදවීමට කටයුතු කර ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**